ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය
இலங்கை பத்திரிகை ஸ்தாபனம்
Sri Lanka Press Institute

# ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් තහවුරු කරන්න - ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය, එහි හවුල්කාර සාමාජිකයන් සහ ඊට අනුබද්ධිත සංවිධාන එක්ව අවධාරණය කරන්නේ, වත්මන් නොසන්සුන්කාරී වාතාවරණය තුළ, කිසිදු කඩකිරීමකින් තොරව ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සහ නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක කිරීමට රජය ක්‍රියා කළ යුතු බවයි. විශේෂයෙන්ම භාෂණයේ සහ අදහස් ප්‍රකාශනයේ අයිතිය, ජනමාධ්‍ය නිදහස සහ රාජකාරියේ යෙදෙන ජනමාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව ඇතුළු යහපාලනයක් තුළ පැවැතිය යුතු අනෙකුත් සෑම ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක්ම තහවුරු කොට සුරක්ෂිත කිරීමද,ව්‍යවස්ථාපිතව සහතික කර ඇති පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමද රජයේ වගකීමකි. සමාජ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා මෙම අගයන් සපුරාලීම ප්‍රමුඛ අවශ්‍යතාවයක් බවද පුවත්පත් ආයතනය අවධාරණය කරයි. මෙම තීරණාත්මක අවස්ථාවේදී සාමකාමීව සහ නීත්‍යානුකූලව කටයුතු කරන ලෙසටත්, සියලු කටයුතු නීතියේ ආධිපත්‍යය තුළ සිදුවන බවට සහතික වන ලෙසත් ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය මහජනතාව ඇතුළු සියලු වගකිවයුතු පාර්ශවයන්ගෙන් ඉල්ලා සිටී.